## විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

### සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව



# සිහිනයක් වගේ.... 14

ගමනක් යන්න පටන් ගත්තම තමන් එක්ක එන අය ගැන හිත හිතා ඉන්න ඕනෙ නෑ ඉසුරයියෙ.. කා ගැනවත් හිතන්නැතුව තමන්ගෙ ආත්ම ශක්තිය ගැන විතරක් විශ්වාස කරගෙන ඉස්සරහට යන්න..

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

ස්නේහා ඉසුර කී කතාවට සිනාසුණේ නැත. ඒ වෙනුවට ඇගේ මුහුණේ දිස්වූයේ ගැඹුරු පෙනුමකි.

"ගමනක් යන්න පටන් ගත්තම තමන් එක්ක එන අය ගැන හිත හිතා ඉන්න ඕනෙ නෑ ඉසුරයියෙ.. කා ගැනවත් හිතන්නැතුව තමන්ගෙ ආත්ම ශක්තිය ගැන විතරක් විශ්වාස කරගෙන ඉස්සරහට යන්න.. දිනන අය එහෙම තමයි .. ඒ අය හැරිලවත් බලන්නෙ නෑ කවුද තමන් එක්ක එන්නෙ කියල.. මං කැමතියි ඔයා දිනනවා බලන්න.. ඔයා එක්ක එක පෙළට ආවෙ නැතත් මං ඈත ඉඳන් ඔයාගෙ ජයග්‍රහණය බලලා සතුටු වෙනවා.."

ඇගේ කතාව අසා සිටියා විනා ඔහු කිසිවක් නොකීවේ ය. ඔහුගේ මුහුණේ විසල් කණගාටුවක් ඇඳී තිබෙනු ස්නේහා දුටුවා ය. එහෙත් එයින් සිත සොළවාගන්නට ඈ නොසිතුවා ය. ඔහු ව්‍යාංගර්ථයෙන් කියන දේ ඇයට වැටහෙයි. කුමක් හෝ හේතුවක් නිසා ඔහු හා එකගල වන්නට නොහැකි බවක් ඇයට දැනෙයි. ඔහු සහෝදරයකු සේ ය. පුංචි වුන් සන්දියේ සිට එකට කෙළි සෙල්ලම් කළ සහෝදරයා ඔහුය. ඔහු වෙනුවෙන් සිය හදවත විවර නොවන්නේ එනිසා විය හැකි බව ස්නේහා ට දැනෙයි.

දිග කල්පනාවක ගැලී සිටි ස්නේහා හිස ඔසවා බලන විට ඔහු ඈත යමින් සිටියේ ය.

"අයියේ" ස්නේහා කෑගැසුවා ය.

ඔහු නැවතී හැරී බැලූවේ ය.

"කැන්වසිං යන්න මාත් එනවා.. අපි කොහොම හරි දිනන්න ඕනේ" ඈ කෑ ගසා කීවා ය. ".. හොරු වෙනුවට අවංක මිනිසුන්ට ඡන්දෙ දෙන්න කියලා ගමටම කියන්න මාත් කැන්වසින් යන්න එනවා"

ඔහු සිනාසුණේ ය. ඒ සිනාව අපූරුය.

"අන්න එහෙම හිනාවෙලා ඉන්ඩකො... මිනිස්සු ඡන්දෙ දෙන්නෙ හිනාවෙලා ඉන්න අයට.. බොරුවට හරි හිනා වෙලා ඉන්ඩ.. කොහොමත් මේ රටේ මිනිස්සු කැමති බොරුකාරයන්ටම තමයි" ස්නේහා කවට කතා කීවා ය.

ගමේ දවස් අගනුවර දවස් මෙන් වේගයෙන් යන්නේ නැත. කඳු වළල්ලට ඔබ්බෙන් ඉර පායා සවස බැස යන්නට ගතවන කාලය තුළ බොහෝ දේ සිතන්නට ස්නේහාට අවකාශයක් තිබුණි. ඇල්ලට දිය නාන්නට යන්නට, කුඹුරු යායේ ඇවිදින්නට පමණක් නොව සවසට පන්සලට යන්නට පවා ඇයට ඕනෑ තරම් අවකාශ තිබුණි. උදෑසන නැගිට මිදුල් ඇමද බුදු පහන තියා ගෙදරට වතුර කළගෙඩි දෙකක් ගෙනැවිත් දීම ඇගේ දින චරියාවේ පළමු අංග අතර තිබුණි. ඉන්සපු අම්මාට උයන්නට උදව් කරන්නට ඇය පුරුදුව සිටියා ය.

"ඉස්කෝලෙ යන කාලෙත් ඔයා මේ විදිහටම මට උයන්න උදව් වුණා" අම්මා කියන්නේ ආදරයට ය. ස්නේහා අම්මාගේ ඇගේ දැවටී සිනාසුණා ය. "තාමත් හුරතලේ" අම්මා කීවා ය. ".. දැන් මොකද මගේ දුවේ කරන්නෙ? ආපහු කොළඹ යනවද..? ගමේම ඉන්නව ද..?" අම්මා ඇසුවේ ම ස්නේහා තිස්ස දෙවේලේ සිතමින් සිටින පැනයම ය.

දිගටම ගමේම සිටින්නට බාධාවක් නැත. එහෙත් රැකියාවට ගොස් යමක් උපයා ගේ දොර තවත් ටිකක් දියුණු කරගන්නට ඇගේ සිතේ ඇති ආශාව එයට වඩා බලවත් ය. තාත්තාට තව බොහෝ කාලයක් මේ බර අදින්නට නොහැකි ය. තමා රැකියාවකට යාම ඔහුට කරන උදව්වක් වනු ඇති බව ස්නේහා දැන සිටියා ය.
"මං ආපහු යන්න ඕනෙ අම්මා.. දිගටම ගමේ ඉන්න ආසයි.. ඒත් ඉගෙනගත්ත දෙයින් ප්‍රයෝජනයක් ගන්න ඕනෙ.. හොස්පිටල් එකෙන් මට කතා කළොත් මං යනවා"

"අර දොස්තර මහත්තය කිව්ව තැනට යන්න හිතන්නෙ නැද්ද පුතේ ඔයා?" අම්මා අසන්නේ දොස්තර මේනකගේ යෝජනාව ගැන ය. ඒ ගැන සිතන්නට පවා ස්නේහා පසුබට වූවා ය.

දොස්තර මේනක හොඳ ගති පැවතුම් ඇති අයෙක් යයි ඇයට සිතෙයි. කවදාවත් ඔහු පිලිබඳ නරක යමක් ඈ අසා නැත. ඔහු තමා කෙරෙහි දක්වන මේ උනන්දුව තුළ සැඟවුණ බලාපොරොත්තුවක් තිබිය හැකි ය. ඒ ගැන සිත්නන්ට පවා බයක් සිතෙයි. ඔහු නම ගිය වෛද්‍යවරයෙකි. ප්‍රසිද්ධ චරිතයකි. ධනවතෙකි. එවැන්නෙකු හා යන්නට ගමනක් තමාට තිබිය නොහැකි ය. එය නොගැළපෙන සහජීවනයක් වනු ඇත.

"මගේ දුප්පත්කම තියාගෙන මං පැත්තකට වෙලා ඉන්නවා.." ස්නේහා සිතුවේ එහෙම ය. ඒ දේවල් අම්මාට කියන්නට නොහැකි ය.

නිසැකවම ඔහු ජයග්‍රහණය කරනු ඇත. සිරිවර්ධන මහතාගේ දුරකතන ඇමතුම ස්නේහාට ලැබුණේ ඒ සතියට පසුව ය.

"ස්නේහා සඳුදා ඉඳන් වැඩට එන්න.." ඔහු වැල්වටාරම් නැතිව කීවේ ය. "මට අලුත් වර්කිං ඩිරෙක්ටර්ගෙන් අනුමැතිය ලැබුණා.." හිතේ ඇතිවුණ සතුට ස්නේහා ටික වේලාවකට ගොලු කරන්නට සමත් විය.



"මං කැමතියි මං වැඩ කරපු තැනටම යන්න තියෙනවා නම්.. දන්න තැන නිසා ලේසියි අම්මා. අලුත් තැන්වලට පුරුදු වෙන්න මට බෑ වගේ" ස්නේහා කීවේ බොරුවක්ම නොවේ.

"ඒක හොඳයි... අපටත් බයක් නෑ" අම්මා කීවාය.

ස්නේහා සතියක්ම ඉසුර සමග කැන්වසින් ගියා ය. ගම පුරා ඇවිදිමින් ගෙයින් ගෙට යමින් කළ ඡන්ද ව්‍යාපාරය ඉසුරට වාසිදායක වන බව ස්නේහා තේරුම් ගෙන තිබුණි.

"අනේ කොයි තරම් දෙයක්ද සර්" ස්නේහා කීවා ය.

"ඔයාට වෙනද වැඩ කළ වෝඩ් එකේම වැඩ කරන්න පුලුවන්.. කිසිම ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ.. සඳුදා උදේම ඇවිත් මාව හමුවෙන්නෙ.." සිරිවර්ධන මහතාගේ කාරුණික කටහඬ ස්නේහා අසා සිටියා ය. සියල්ල නිසි ලෙස සිදුවෙමින් පවතියි. ජීවිතයට නැවතත් සතුට ලැබෙණු ඇතැයි ඇයට සිතුණි.

**මතු සම්බන්ධයි**